කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

# නාට්‍ය හා රංගකලාව (නව/පැරණි නිර්දේශය)

## පෙරදිග ගැමිනාටක හා සම්භාව්‍ය රංග සම්ප්‍රදා DMAT – 2025

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

## I කොටස

01. සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ ඉදිරිපත් වී ඇති මතවාද විවේචනාත්මක ව සාකච්ඡා කරන්න.

නැතහොත්

"සංස්කෘත නාට්‍ය කලාව ඊටම අනන්‍ය වූ ශෛලීය ලක්ෂණ සහිත ව ගොඩනැංවී ඇත." උදාහරණ සහිත ව විමසන්න.

02. සම්භාව්‍ය සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය අනුව නාට්‍යයක කතාවස්තුව (plot) ගොඩනැංවීමේ සිද්ධාන්ත නිදසුන් සහිත ව විවරණය කරන්න.

03. බෞද්ධාගමික මතවාද සාකච්ඡා කිරීමේ නෝ නාට්‍යකරුවාගේ උත්සාහය නාට්‍යමය උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

04. බෙයිජින් ඔපෙරාවේ (Beijing Opera) රූපණය සහ චරිත වර්ගීකරණය සතුව ඇති සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

## II කොටස

05. පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍යමය මූලාශ්‍රය ඇසුරු කර ගනිමින්, ඉන්දියාවේ ජන නාටකවල ඉතිහාසය පිළිබඳ විමර්ශනය කරන්න.

06. පෙරදිග ජන නාට්‍ය සඳහා රාමායණය බලපා ඇති අයුරු නිදසුන් සහිතව විවරණය කරන්න.

07. "සම්භාව්‍ය සංස්කෘත නාට්‍ය කලාවේ ලක්ෂණ ඉන්දීය ගැමිනාටකවල දැකිය හැකිය." මෙම ප්‍රකාශය නිදසුන් සහිතව සනාථ කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. භාරතීය ජන නාට්‍ය කලා වර්ගීකරණය
ii. රාම්ලීලා සහ රාස්ලීලා
iii. යක්ෂගාන් සහ භාග්වත්මේලා නාටක
iv. නෞටංකී සහ ස්වාංග්
v. තායිලන්තයේ හෝ මියන්මාරයේ ජන නාට්‍ය

*****************************